සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.27

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College Kandana 9314

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 03 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .............................. විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I කොටස

වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.

1. ගිබියොන් හි ප්‍රධාන කඳු මත පූජාසනය පිට දවනයාග පූජා දහසක් පුද කළේ
   i. ආබ්‍රහම් තුමා ii. මෝසෙස් තුමා iii. සලමොන් රජතුමා iv. දාවිත් රජතුමා

2. නව ගිවිසුමේ ඉතිහාස පොත වන්නේ,
   i. එළිදරව් පොත ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය
   iii. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත iv. ජෝෂුවාගේ පොත

3. "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනි" යයි පැවසුයේ,
   i. මාර්තා හා මරියා- ලාසරස් උත්ථාන වූ අවස්ථාවේ.
   ii. ශ්‍රාවකයන් විසින් - මාරුත දමනය වූ අවස්ථාවේ
   iii. ශු තෝමස් අපෝස්තුලුවරයා - ක්‍රිස්තු උත්ථානය පිළිගත් අවස්ථාවේ
   iv. ජේසුස් වහන්සේ - කුරුසගසෙහි උකුත් වීමට පෙර

4. ජේසුස් වහන්සේ අදහා ගනිමින් පේදුරු තුමා අතින් බෞතිස්මය ලැබූ විජාතික ශතාධිපතියා වන්නේ,
   i. ශුද්ධ වූ පාවුලු තුමා ii. ශුද්ධ වූ ලූක් තුමා
   iii. කොරනේලියස් තුමා iv. පිලිප් තුමා

5. ජේසුස් වහන්සේ පේදුරු තුමාව "භාග්‍යවන්තයෙක්" යැයි පවසන ලද්දේ,
   i. මුල් කිතුනු සභාවේ එඩේරික වගකීම එතුමාට පවරා දුන් නිසා ය.
   ii. පේදුරු තුමා සැබෑ ලෙස පසුතැවිලි වූ නිසාය
   iii. ස්වර්ගීය යතුර හෙබවීමට බලයලත් තැනැත්තා වූ නිසාය
   iv. ජේසුස් වහන්සේ ක්‍රිස්තුවරයා හා දේව පුත්‍රයා බව ප්‍රකාශ කළ නිසා ය.

6. කතෝලිකත්වය යනු
   i. ශුද්ධ වූ සභාවේ එකමුතුකමයි ii. ශුද්ධ වූ සභාවේ විශ්වීය බවයි
   iii. ශුද්ධ වූ සභාවේ දූත කාර්යයේ අනන්‍යතාවයි iv. ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාවයි

7. කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන්ම අග්‍රස්ථානය වන්නේ,
   i. ශුද්ධ වූ පවුල ii. කිතුනු පවුල
   iii. ශුද්ධ වූ ත්‍රිත්වය iv. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

8. පුරාණ ගිවිසුමේ යාග පිළිබඳව කරුණු ගෙන හැර දක්වන ග්‍රන්ථය වන්නේ,
   i. ද්විතීය නීති සංග්‍රහය ii. ගීතාවලිය iii. ලෙවීව්‍යවස්ථාව iv. ගණන් කථාව

9. ජාතීන්ගේ විනිශ්චය දවසේ දී අප එකිනෙකාගේ යහපත් ජීවිත තීරණය කරනු ලැබීමට ක්‍රිස්තුස් වහන්සේ තෝරාගනු ලබන මිනුම් දණ්ඩ වන්නේ,
   i. යාච්ඤා ජීවිතය ii. ශාරීරික පුන්‍ය ක්‍රියා
   iii. ප්‍රේමයේ පනත iv. ප්‍රසාද නිධාන ජීවිතය

10. විශ්වාස, බලාපොරොත්තුව, දේව ප්‍රේමය මත පදනම් වන දේව පනත වන්නේ,
i. පළමුවන දේව පනත
ii. හතරවන දේව පනත
iii. තුන්වන දේව පනත
iv. පස්වන දේව පනත

11. විවාහ පොරොන්දුව කඩ කිරීම හා මයඨාදාවට විරුද්ධව ක්‍රියා කිරීම අදාළ වන්නේ,
i. 7 හා 10 දේව පනත් වලටය
ii. 6 හා 9 දේව පනත් වලටය
iii. 1 හා 2 දේව පනත් වලටය
iv. 5 හා 8 දේව පනත් වලටය

12. ''ඔබේ මුළු සිතින් ඔබේ පියාට ගෞරව කරන්න. ඔබේ මව විඳි ප්‍රසව වේදනාව කිසි දිනෙක අමතක නොකරන්න'' මෙසේ සඳහන් වන්නේ,
i. උපදේශකාය හෙවත් සිරාක් ග්‍රන්ථයේය
ii. කොලොස්සි ග්‍රන්ථයේ ය.
iii. හිතෝපදේශය ග්‍රන්ථයේ ය.
iv. එපිස ග්‍රන්ථයේ ය.

13. සුරදූත ගීතය (ග්ලෝරියා) ගායනා කරන්නේ,
i. ආගමන සමයේ ය.
ii. චතාරික සමයේ ය.
iii. මංගල්‍යය හා ඉරිදා දිනවල ය.
iv. සෑම සෙනසුරාදා දිනකමය.

14. සාලොම් නුවර යනුවෙන් අදහස් කළේ
i. රෝමය
ii. ජෙරුසලමය
iii. නාසරෙත් ය
iv. කානාන් ය.

15. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව නම්,
i. පොදු යැදුමයි
ii. සාදුකාරයයි
iii. පඬුරු මත යැදුමයි
iv. ස්තෝත්‍ර යාගික යැදුමයි

16. සාමාන්‍ය සමය තුළ සමරණ මංගල්ලයක් වන්නේ,
i. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගලෝත්සවය
ii. ශුද්ධ වූ පාවුලේ මංගලෝත්සවය
iii. මරියතුමියගේ නිර්දෝෂ පිළිසිඳීමේ මංගලෝත්සවය
iv. පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගලොත්සවය

17. ''මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාකූලය, මෙහි නැවතී අවදිව සිටින්න'' ජේසුස් වහන්සේ මෙසේ පැවසුයේ,
i. ජෙරුසලම් දේව මැඳුරේ දී ජනතාවටය ය.
ii. නායක පූජකයා ඉදිරියේ ශ්‍රාවකයන්ට ය.
iii. ගෙත්සෙමනියේ දී ශ්‍රාවකයන්ට ය.
iv. මල් උයනේදී තම මෑණියන්ට හා සහෝදරයන්ටය.

18. ජේසුස් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ව ද පිරිවරාගෙන ස්වර්ගීය පියාණන් වහන්සේට කළ යාච්ඤාව වන්නේ,
i. ස්වාමිවාක් ආරාධනාව
ii. උත්තම පූජක යාච්ඤාව
iii. ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව
iv. මල් උයනේ යාච්ඤාව

19. ජනවාරි මස පළමුවන දින සමරනු ලබන වැදගත් මංගල්‍යය වන්නේ,
i. ශුද්ධ වූ පාවුලේ මංගල්‍යයයි.
ii. ජේසු බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යයයි
iii. නිදොස් බිළිඳුන්ගේ මංගල්‍යයයි
iv. පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යයයි

20. සෑම වසරකම ජනවාරි මස 18 සිට 25 දක්වා යැදුම් සතියක් පැවැත්වේ. එම සතිය නම් කර ඇත්තේ,
i. කිතුනු පවුල් නගාලීමේ සතිය වශයෙනි
ii. ගැලවීමේ සැලැස්ම ක්‍රියාවට නන්වන සතිය වශයෙනි
iii. දේව වචනය ප්‍රකාශ කරන්නන්ගේ සතිය වශයෙනි.
iv. කිතුනු සභා සමගි සතිය වශයෙනි.

21. ''මනුෂ්‍ය පුත්‍රයා'' යන සංකල්පය දිවැසිවර කාර්යය තුළ ගෙනහැර දක්වන දිවැසිවරයා,

i. යෙසායා
ii. එසකියෙල්
iii. ජෙරමියා
iv. ජෝනා

22. ''ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි ''මෙසේ පවසන්නේ

i. ආබ්‍රහම් තුමා
ii. තෙරේසා මව් තුමිය
iii. ජේසුස් වහන්සේ
iv. ජාකොබ් තුමා

23. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව ''ස්වර්ගයේ ජීවත්වීම'' යනු

i. ආත්මය, ස්වර්ගීය සැපත භුක්තිවිඳීම
ii. ක්‍රිස්තුන් වහන්සේ සමග විසීම
iii. ඇතුළාන්ත සාමය හා ප්‍රීතිය අත්දැකීම
iv. යාච්ඤාමය ජීවිතයක් ගත කිරීම

24. ''ධර්මදානය'' සඳහා බයිබලීය පදනම ප්‍රකාශ වන්නේ,

i. "ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න''
ii. "පියාණන්ගේද, පුත්‍රයාණන්ගේද, ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් ඔවුන් බෞතිස්ම කරන්න''
iii. "මා ඔබට අණකළ, සියල්ල රක්ෂා කරන්න, ඔවුනට උගන්වන්න.''
iv. "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න."

25. දෙව්දුන් ප්‍රිය පඬුර නම් ......... (ගීතාවලිය 51/17) අනුව,

i. යාච්ඤාවයි
ii. දයා ප්‍රේමයයි
iii. ආත්ම දමනයයි
iv. බිඳුණු හදවතයි

26. විවාහ ගිවිසුමක් දේව ප්‍රසාද නිධානයක් වීම සඳහා අත්‍යාවශ්‍යය කරුණ වන්නේ,

i. ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනෙකු වීම
ii. දේවස්ථානයක විවාහ වීම
iii. විවාහ පොරොන්දුව එකිනෙකාට පැවසීම
iv. පියතුමා මගින් දේව ආශිර්වාදය ලබා ගැනීම

27. පැවිදි ජීවිතයේ ලක්ෂණ තුන නිවැරදිව සඳහන් වන්නේ,

i. විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය
ii. ව්‍රත ශුද්ධිය, කීකරුකම, දිළිඳුකම
iii. සාංඝික ජීවිතය, යාච්ඤාවේ හා සේවයේ ජීවිතය
iv. කීකරුකම, බඹසර රැකීම, දේව විශ්වාසය

28. 16 වන සියවස තෙක් පැවති භාවනා ක්‍රමය වන්නේ,

i. ධ්‍යානශීලි කියවීම
ii. අසිපා
iii. සදාචාරාත්මක භාවනාව
iv. ක්වායටිසම්

29. උදායාම යැදුම සඳහා උපයෝගී කරගත හැක්කේ,

i. සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය
ii. සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය
iii. මරියතුමියගේ උදාන ගීතය
iv. දේවදූත ගායනය - ග්ලෝරියා

30. ජේසුස් වහන්සේ හැත්තෑ (70) දෙනා ධර්මදූත සේවයට යැවීම මගින් අදහස් කරන්නේ,

i. එකල ලොව තුළ ජාතීන් 70 ක් සිටි බවය
ii. ධර්මදූත සේවය සඳහා සියලු දෙනා ඉදිරිපත් විය යුතුබවය
iii. සියලු ජාතීන් වෙත සුබ අස්න රැගෙන යා යුතු බවය
iv. 70 දෙනෙකු විසින් ධර්මදූත සේවය ආරම්භ කළ බවය.

31. අධ්‍යාත්මික ශුභාරංචිය ලෙස හඳුන්වනු ලබන්නේ,
i. මතෙව් ශුභාරංචියයි
ii. මාක් ශුභාරංචියයි
iii. ලූක් ශුභාරංචියයි
iv. ජොහාන් ශුභාරංචියයි

32. මිසර වැසියන්ට පැමිණි 7, 8, 9 වසංගත අනුපිළිවෙලට සඳහන් වන්නේ,
i. ගල් වර්ෂාව/පළගැටි උවදුර/ඝනඳුරු උවදුර
ii. වතුර ලේ වීම/මැඩි උවදුර/කිනිතුලු උවදුර
iii. මැසි උවදුර/මැඩි උවදුර/කිනිතුලු උවදුර
iv. ගල් වර්ෂාව/මැසි උවදුර/පළගැටි උවදුර

33. ජේසුස් වහන්සේට පාළුකරයේ දී පැමිණි දෙවන පරීක්ෂාවෙන් (ලූක්තුමාගේ ශුභාරංචියට අනුව) ලැබෙන පණිවිඩය වන්නේ,
i. කීර්තිය පතා වැඩ කටයුතු නොකළයුතු බවයි
ii. ධනය පතා වැඩ කටයුතු නොකළ යුතු බවයි
iii. බලය පතා වැඩ කටයුතු නොකළ යුතු බවයි
iv. මමත්වය පතා වැඩ කටයුතු නොකළ යුතු බවයි

34. ඇතුළාන්ත සාමයට මූලික වන්නේ
i. සත්‍යය, යුක්තිය, ප්‍රේමය හා නිදහස
ii. විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය, ශුද්ධත්වය
iii. ප්‍රඥාව, ධෛර්යය, දේව භක්තිය, දේව භය
iv. සාමය, නොබිඳෙන දිරිය, ඉවසීම, සමාව දීම

35. භාග්‍යවන්ත පෙඩ්රික් ඔසානම් තුමා විසින් ආරම්භ කරන ලද්දේ,
i. ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදය සමිතිය
ii. මරිය හමුදාව
iii. සාන්ත වින්සන්ද පාවුලා සමිතිය
iv. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය

36. ද්විතීය සම්මත ග්‍රන්ථ වන්නේ,
i. සිරාක්, දානියෙල්, මීකා, එස්රා
ii. ජූදිත්, ජෝබ්, ගීතාවලිය, එස්තර්
iii. බාරුක්, ප්‍රඥාව, එස්රා, ලෙවී
iv. බාරුක්, ජූදිත්, තෝබිත්, සිරාක්

37. ද්විතීය නීති සම්ප්‍රදායේ ලක්ෂණයක් වන්නේ,
i. ආගමික වතාවත් හා ජවන්දනාවට විශේෂ අවධානයක් දී ඇත.
ii. භාෂා ශෛලිය අනුශාසනාත්මකය
iii. දෙවියන් වහන්සේ මිනිසාට ඉතා සමීප බව දැක්වීම
iv. දෙවියන් වහන්සේ අති උත්කෘෂ්ට බව දැන්වීම

38. ධ්‍යානයට සම වැදීම, භාවනාවේ උසස් තලයකට පැමිණි අයට පමණක් කළ හැකි භාවනාවක් වන්නේ,
i. ජන්සෙනිසම්
ii. ලේක්සියෝ ඩිවිනා
iii. සදාචාරත්මක භාවනාව
iv. ක්වායටිසම්

39. "ත්‍රි එක සුර ජේසුනේ" යන ගීතිකාව රචනා කර ඇත්තේ,
i. මර්සලින් ජයකොඩි පියතුමා
ii. ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
iii. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමා
iv. අති උතුම් ඔස්වල්ඩ් ගෝමස් රදගුරු හිමිපාණන්

40. ශුද්ධ වූ සභා විනය හා සෙසු කාරණා පිළබඳ නීතිරීති ඇතුළත් වන්නේ,
i. ජීවන සභා සම්ප්‍රදායේ ය.
ii. සභා නීති සංග්‍රහයේ ය.
iii. කතෝලික සභා ධර්මෝපදේශයේ ය.
iv. ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද වලය.

2024.02.27
ශ්‍රේ. 11

Learning Resource Cell
R
De Mazenod College
Kandana

9305

## II කොටස

සැලකිය යුතුයි,
පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

1. අනිවාර්යය ප්‍රශ්නය
   1. එළිදරව් සාහිත්‍යයේ එන සංකේත භාවිතයෙහි පරමාර්ථ දෙක ලියා දක්වන්න.
   2. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා හා අපොස්තුළුවරුන් අතර පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා නම් කරන්න.
   3. පාවුලු තුමා හා සිලස් ඇරඹි දෙවන ධර්මදූත ගමනට එක් වූ අනෙක් දෙදෙනා කවුරුන් ද?
   4. ජන වන්දනාව තුළ සුදු වර්ණය භාවිත කරන කාල (සමය) දෙක ලියා දක්වන්න.
   5. ජේසුස් වහන්සේව අත් අඩංගුවට ගැනීමට පැමිණි අවස්ථාවේ දී සිදු වූ සිද්ධි දෙකක් ලියන්න.
   6. මතෙව් ශුභාරංචියේ හා ජොහාන් ශුභාරංචියේ පරමාර්ථ දෙක ලියන්න.
   7. දෙවියන් වහන්සේ විසින් නොවා ව කැඳවීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්න.
   8. ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සුදු වස්ත්‍රයේ හා පාස්කු ඉටි පහනේ අර්ථයන් ලියා දක්වන්න.
   9. යාම යැදුම සඳහා භාවිතා කරන ප්‍රශංසා ගී දෙකක් ලියන්න.
   10. අප අයදින සියල්ල අපට නොවැරදීම ලැබෙන බවට විශ්වාස කරමින් කරන යැදුම හඳුන්වන නම් දෙකක් ලියන්න. (ල. 2x10)

2. 1. පුරාණ ගිවිසුමෙහි සඳහන් වන ආකාරයට ස්නාවක ජොහාන් තුමාගේ වගකීම් දෙකක් ලියන්න. (ල. 2)
   2. ස්නාවක ජොහාන් තුමා විවිධ ජන කොටස් සඳහා කළ ඉගැන්වීම් තුනක් ලියන්න. (ල. 3)
   3. ස්නාවක ජොහාන් තුමා අද සමාජයට පැමිණියොත්, කුමන පාර්ශව වෙත කුමක් පවසනු ඇත්දැයි කරුණු පහකින් පහදන්න. (ල. 5)

3. 1. චතාරික සමයේ ආරම්භක හා අවසාන දිනයන් නම් කරන්න. (ල. 2)
   2. ජන වන්දනා වසර තුළ ශුද්ධ වූ දින ත්‍රිත්වය නම් කරන්න. (ල. 3)
   3. කතෝලික අපට ''පාස්කු සමය''වැදගත් වන්නේ ඇයි දැයි කරුණු පහකින් විස්තර කරන්න. (ල. 5)

4. 1. ස්ත්‍රෝත්‍ර යාගික පිළිවෙතේ ප්‍රධාන කොටස් දෙකක් ලියා දක්වන්න? (ල. 2)
   2. දිව්‍ය පූජාවේ දක්නට ලැබෙන මුලසුනේ යැදුම් තුනක් නම් කරන්න. (ල. 3)
   3. රටට තිරසර සාමය, ධර්මිෂ්ඨකම, හා සමෘද්ධිය පතා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (අංග සම්පූර්ණ යාච්ඤාවක තිබිය යුතු ව්‍යුහය යටතේ) (ල. 5)

5. i. දේව රාජ්‍යයේ වටිනාකම් පෙන්වා දීම සඳහා ජේසුස් වහන්සේ වදාළ උපමා දෙකක් නම් කරන්න. (ල. 2)

ii. නව යොවුන් වියේ සිටින දූ පුතුන්ගේ ජීවිත ගොඩ නංවා ශක්තිමත් කිරීම සඳහා හඳුන්වා දී ඇති "H" තුන නම් කරන්න. (ල. 3)

iii. අද සමාජය තුළ කිතුණු වගකීම් ඉටු කළ හැකි ආකාර පහක් කන්ද උඩ දේශනය ඇසුරෙන් ලියා දක්වන්න. (ල. 5)

6. i. ආරම්භක දේව ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ආත්මික මවක්, පියෙක් වීමට තිබිය යුතු සුදුසුකම් තුනක් ලියන්න. (ල. 3)

iii. ක්‍රිස්තුන් වහන්සේගේ ඉහ්වා භටයකු ලෙස වරප්‍රසාද ලබන සක්‍රමේන්තු දිව්‍ය පූජාවේදී කිවහැකි ''විශ්වාසික යැදුම්'' පහක් නිර්මාණය කරන්න. (ල. 5)

7. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i. ගබ්සාව මිනී මැරීමකි.

ii. සමගි සන්ධාන ප්‍රසාද නිධානයේ ප්‍රතිඵල

iii. අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් මුනිතුමා

iv. ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා (ල. 2x5 =10)